*සැ. යු.* - 2024.05.10 දින පළ වූ අංක 2384 *ගැසට් පත්‍රයේ* II සහ IV(අ) කොටස් පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,385 - 2024 මැයි මස 17 වැනි සිකුරාදා - 2024.05.17**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 148 |
| මුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 150 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 ජුනි මස 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මැයි මස 22 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## කොළඹ දිසා අධිකරණයේ දී ය

### පිස්කල් මඟින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

එලායන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී.,
අංක 84, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

නඩු අංක : DMB/187/19
ඇස්කීසි අංකය : 06/2024
ස්වභාවය : උකස්
වටිනාකම : රු. 3,570,050.60

*.............පැමිණිලිකරු.*

*එදිරිව*

වීරසිංහ ආරච්චිගේ රසිකා ශ්‍යාමලී පෙරේරා,
අංක 83/7 ඒ, දඹහේන පාර, මහරගම.

*...................විත්තිකරු.*

කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවේ 2022.10.05 වැනි දින ඇතුලත් කරන ලද සමථය පරිදි විත්තිකරු විසින් එකී සමථය කඩ කර ඇති බැවින්, සමථ තීන්දු ප්‍රකාශය පරිදි,

*(අ)* ඉහත විත්තිකරු පැමිණිලිකාර සමාගමට රුපියල් තිස් පන් ලක්ෂ හැත්තෑ දහස් පනහයි ශත හැටක (රු. 3,570,050.60) මුදල හා ඒ මත පොළිය ගෙවීමට පැහැර හැර ඇති බවට හා එකී මුදල් ගෙවීමට බැඳී ඇති බවට නඩු තීන්දුවක් ලබාදෙන ලෙසටත්,

*(ආ)* විත්තිකරු ඉහත රුපියල් තිස් පන් ලක්ෂ හැත්තෑ දහස් පනහයි ශත හැටක (රු. 3,570,050.60) යන මුදල හා නෛතික පොලිය පියවීමේ සුරක්ෂිතයක් ලෙස පැමිණිලිකරු වෙත ලබා දී ඇති ඉහත ප්‍රසිද්ධ නොතාරිස් ටී. ඩී. එෆ්. ඒ. ගුණවර්ධන මහත්මිය විසින් ලියා සහතික කරන ලද අංක 3875 දරන උකස්කරය නීතිය ඉදිරියේ ක්‍රියාත්මක කර ගැනීම සඳහා නියෝග යක් ලබා දෙන ලෙසත්,

*(ඇ)* නඩු ගාස්තු ලබා දෙන ලෙසත්, සමථය පරිදි ගෙවිය යුතු රුපියල් 3,800,000.00 මුදලින් ගෙවා ඇති රුපියල් 345,000.00 ක මුදල අඩු කර ඉතිරි මුදලවන රුපියල් 3,455,000.00 ක මුදල අය කර ගැනීමටත් දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට **2024.01.24** වැනි දින මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024 ක් වූ මැයි මස 30 වැනි දින පෙ.ව. 10.30** ට ඉහත නම් සඳහන් විත්තිකරුගේ නිශ්චල දේපළ උපලේඛනයේ සඳහන් ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹහේන 528 ඒ ග්‍රාම නිලධාරී වසම තුළ පමුණුව පිහිටි දඹහේන පටුමග, වරිපනම් අංක 83/7/ඒ දරන ''දඹහේනවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ඒ. ඩබ්ලිව්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 679 සහ 2004.01.14 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 02 සඳහා මායිම්, උතුරට : එස්. ජයසේකර සහ තවත් අය හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ජේ. චන්ද්‍රරත්න හිමිකම් කියන ඉඩම (පිඹුරු අංක 1217 හි ලොට් 07) සහ පාර ද, දකුණට : ඒ. බී. සියඹලාගොඩ හිමිකම් කියන ඉඩම (පිඹුරු අංක 1211 හි ලොට් 4) ද (බලයලත් මිනින්දෝරු ඩී. එස්. එස්. කුරුප්පු විසින් මැන සාදන ලද අංක 3728 සහ 1996.10.20 වන දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 2 ඒ හි උප බෙදන ලද කොටසකි), බටහිරට : ලොට් 01 ද යන මායිම් වූ ප්‍රමාණයෙන් දෙල්කඳ- නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2735/225 හි ලියාපදිංචි වී ඇත.)

*පොදු මාර්ග පරවශතා අයිතිය.-*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දඹහේන 528 ඒ ග්‍රාම නිලධාරී වසම තුළ පමුණුව පිහිටි ''දඹහේනවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. පී. සී. ඩයස් විසින් මැන සාදන ලද අංක 1211 සහ 1976.10.30 දින දරන පිඹුර ප්‍රකාර ලොට් අංක 06 සඳහා මායිම් : උතුරට : ලොට් 07 සහ ලොට් 08 ද, නැගෙනහිරට : එම්. සුබනේරිස් කොස්තා හිමිකම් කියන ඉඩම සහ ගම්සභා පාර ද දකුණට: ලොට් 05 සහ 04 ද, බටහිරට : ලොට් 05 සහ 02 ද, යන මායිම් වූ ප්‍රමාණයෙන් පර්චස් තුනයි දශම තුනක (පර්. 3.3) විශාලත්වය ඇති ඉඩම සහ

සියලු දේ ද වේ. (මෙය දෙල්කඳ, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M2735/57 හි ලියාපදිංචි වී ඇත.) කැබලි අංක 2 **D** හා කැබලි අංක 2 **F** දරන පොදු මාර්ග පරවශතා අයිතිය සඳහා සමාන අයිතිවාසිකම් ද සමඟ වේ.

*ගෙවීමේ ක්‍රමය :*

වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% මුදලින් ගෙවිය යුතුය.
02. ඉතිරි 75% මුදල ලිත් මසක් ඇතුලත ඉහත අංක දරන නඩුවට අදාළව කොළඹ දිසා අධිකරණයේ තැන්පත් කළ යුතුය.
03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතුය.

ටී. ඩී. එස්. ප්‍රනාන්දු,
රෙජිස්ට්‍රාර්,
නියෝජ්‍ය පිස්කල්.

වර්ෂ 2024 ක් වූ අප්‍රේල් මස 30 වැනි දින දී ය.

05-166

---

## ගම්පහ දිසා අධිකරණයේ දී ය

## පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085,
කොළඹ 02.

*සහ*

අංක 27, රණතුංග පාර, ගම්පහ.

.................*පැමිණිලිකරු.*

නඩු අංකය : 153/MB
ස්වභාවය : උකස්
ක්‍රියාපටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 1,553,695.39
ඇස්කිසි අංකය : 95/19

*එදිරිව*

01. ඉරිප්පුගේ ප්‍රසාද් කුමාර,
අංක 243/ඒ,
අකරවිට, ගම්පහ

02. දෝන චන්ද්‍රිකා ජයසිංහ,
අංක 243/ඒ,
අකරවිට, ගම්පහ

.................*විත්තිකරුවන්.*

වර්ෂ **2015 ක් වූ පෙබරවාරි මස 16** වන දින දරන, මෙම අධිකරණයෙහි තීන්දු ප්‍රකාශය අනුව, විත්තිකරු විසින් පැමිණිලිකාර බැංකුවට රුපියල් විසිදෙලක්ෂ පනස් අටදහස් එකසිය අනූ හයයි ශත තිස් හතක (රු. 2,258,196.37) මුදලක් ගෙවීමට හිඟව ඇති අතර එකී මුදල වාර්ෂික 15.90% පොළියක් මත වාරික 180 කින් මාසික වාරිකය රුපියල් තිස් තුන් දහස් අටයි ශත අසූ දෙකක (රු. 33,008.82) බැගින් ගෙවීමටත්, සෑම මසකම 25 වන දිනට හෝ ගෙවීමටත් අඛණ්ඩව මාසික වාරික ලෙස ගෙවා ණය මුදල අවසන් කිරීමටත්, එසේම ඉහත කී පරිදි විත්තිකරුවන් විසින් එකඟ වූ පරිදි මාසික වාරික දෙකක් එක පිට නොගෙවා පැහැර හැරිය හොත් වර්ෂයක් ගත වුවද විත්තිකරුවන්ට නොතීසි යැවීමෙන් තොරව පැමිණිල්ලේ උපලේඛනයේ සවිස්තරාත්මකව දක්වා ඇති දේපළ තහනම් කිරීමෙන් හා අවශ්‍ය වුවහොත් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා එම මුදල් නඩු ගාස්තු සහ ඇස්කීසි ගාස්තු අයකර ගැනීම සඳහා ඉහත නම සඳහන් විත්තිකරුවන්ට අයත් මා විසින් තහනමට ගනු ලැබූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ සම්බන්ධයෙන් ඔවුන්ට අයත් සියලු අයිතිවාසිකම් හා හිමිකම් **වර්ෂ 2024 ක් වූ ජූනි මස 12 වැනි** දින එම දේපළ පිහිටි ස්ථානයේ දී **ප. ව. 1.00** ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්නට යෙදෙන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, අකරවිට ග්‍රාමයෙහි, අකරවිට පන්සල පාරේ, වරිපනම් අංක 28/11 හි පිහිටි මාරගහ වත්ත නමැති ඉඩමට 2006/08/28 වන දින එච්. ඒ. එන්. පී. රණසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 1205A පිඹුර ප්‍රකාර කැබලි අංක 2A කොටසට මායිම්, උතුරට : පී. සෝමවතීට අයිති එම ඉඩමේම ඉතිරි කොටස සහ පාර ද, නැගෙනහිරට : පිඹුරු අංක 1346 හි කැබලි අංක 02 ද, දකුණට : දූන් කේ. ඒ. ඩී. අබේවර්ධනට අයත් ඉඩම ද, සහ බටහිරට : දූනට කේ. ඒ. ඩී. අබේවර්ධනට අයිති ඉඩම ද, යන මායිම් තුළ පිහිටි පර්චස් විසි පහයි දශම පහක (පර්. 25.5) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් ගහකොළ, පලතුරු ආදී, සියලු දේ ද මාර්ග පරවශතාවයන් ද, සමග ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 628/44 හි ලියාපදිංචි කර ඇත.

අධිකරණයේ අණ පරිදි.
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්.

දිසා අධිකරණය, ගම්පහ.

05-169

---

# විවිධ දැන්වීම්

**(සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින්) කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

| | |
|---|---|
| නඩු අංකය | : CHC/19/2024/CO |
| ස්වභාවය | : සමාගම් |
| කාර්ය පටිපාටිය | : සාමාන්‍ය |
| වටිනාකම | : රු. 8,296,985/- |

මහනුවර, පල්ලේකැලේ, කාර්මික සංවර්ධන මණ්ඩලයේ H3 දරන ගොඩනැගිල්ලේ පිහිටි ''සියරට ආයුර්වේද කොහොඹ පළිබෝධ පාලන (ප්‍රයිවෙට්) ලිමිටඩ්'' යන ආයතනය පිළිබඳ කාරණයේ දී ය.

*සහ*

සියරට ආයුර්වේද කොහොඹ පළිබෝධ පාලන (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගමේ කටයුතු අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා 2007 දරන සමාගම් පනතේ 534 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 270(ඉ) වගන්තිය යටතේ වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

ගිනිගත්හේන, කොළඹ පාරේ, අංක 29D දරන ස්ථානයේ පිහිටි ''කොෆි ෂොප්'' යන නාමය සහ විලාශය යටතේ තනි අයිතිකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන යකන්දාවල ලියන ආරච්චිගේ අනුරුද්ධ යකන්දාවල.

*..........................පෙත්සම්කරු.*

බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් **2024ක් වූ පෙබරවාරි මස 28 වැනි දින** එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ඩබ්ලිව්. එම්. මලින්ද බණ්ඩාර වාසල මහතා ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම **2024.07.31** වැනි දින අධිකරණය ඉදිරියේ විභාග කරනු ලැබීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීම හෝ විරුද්ධ වීමට කැමති එකී සමාගමේ ණයහිමියකු හෝ දායකයකු වේ නම් ඒ තැනැත්තා කාර්යය සඳහා එය විභාග කරන අවස්ථාවේ පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ දායකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පෙත්සම්කරුගේ නීතිඥ,
ඩබ්ලිව්. එම්. මලින්ද බණ්ඩාර වාසල,
අංක 391, 4/2, 4 වන මහල, වේල්ල වීදිය,
කොළඹ 12.

එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ පෙනී සිටීමට කැමැති ඕනෑම තැනැත්තකු තමා විසින් එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ ඩබ්ලිව්. එම්. මලින්ද බණ්ඩාර වාසල මහතා වෙත භාර දිය යුතුය. *නැතහොත් ලියාපදිංචි තැපෑලෙන්*

එවිය යුතුය. එම දැන්වීමේ එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම ලිපිනය සඳහන් කළ යුතු අතර එය එකී තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔවුන්ගේ නීතිඥවරයෙකු වෙතොත් එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම **2024.07.30** වැනි දින **සවස 6.00** ට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

රෙජිස්ට්‍රාර්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2024 මැයි මස 10 වැනි දින.

05-198/1

---

**(සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින්) කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

| | |
|---|---|
| නඩු අංකය | : CHC/21/2024/CO |
| ස්වභාවය | : සමාගම් |
| කාර්ය පටිපාටිය | : සාමාන්‍ය |
| වටිනාකම | : රු. 24,756,960/- |

මහනුවර, පල්ලේකැලේ, කාර්මික සංවර්ධන මණ්ඩලයේ H3 දරන ගොඩනැගිල්ලේ පිහිටි ''සියරට ආයුර්වේද (ප්‍රයිවෙට්) ලිමිටඩ්'' යන ආයතනය පිළිබඳ කාරණයේ දී ය.

*සහ*

සියරට ආයුර්වේද (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගමේ කටයුතු අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා 2007 දරන සමාගම් පනතේ 534 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 270(ඉ) වගන්තිය යටතේ වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

ගිනිගත්හේන, කොළඹ පාරේ, අංක 29D දරන ස්ථානයේ පිහිටි ''කොපි ෂොප්'' යන නාමය සහ විලාශය යටතේ තනි අයිතිකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන යකන්දාවල ලියන ආරච්චිගේ අනුරුද්ධ යකන්දාවල.

*..........................පෙත්සම්කරු.*

බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් **2024ක් වූ පෙබරවාරි මස 28** වැනි දින එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ඩබ්ලිව්. එම්. මලින්ද බන්ඩාර වාසල මහතා ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම **2024.07.31** වැනි දින අධිකරණය ඉදිරියේ විභාග කරනු ලැබීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීම හෝ විරුද්ධ වීමට කැමති එකී සමාගමේ ණයහිමියකු හෝ දායකයකු වේ නම් ඒ තැනැත්තා කාර්යය සඳහා එය විභාග කරන අවස්ථාවේ පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ දායකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පෙත්සම්කරුගේ නීතිඥ,
ඩබ්ලිව්. එම්. මලින්ද බණ්ඩාර වාසල,
අංක 391, 4/2, 4 වන මහල, වේල්ල වීදිය,
කොළඹ 12.

එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ පෙනී සිටීමට කැමැති ඕනෑම තැනැත්තකු තමා විසින් එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ ඩබ්ලිව්. එම්. මලින්ද බන්ඩාර වාසල මහතා වෙත භාර දිය යුතුය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමේ එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම ලිපිනය සඳහන්

කළ යුතු අතර එය එකී තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔවුන්ගේ නීතිඥවරයෙකු වෙතොත් එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම **2024.07.30 වැනි දින සවස 6.00** ට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

රෙජිස්ට්‍රාර්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2024 මැයි මස 10 වැනි දින.

05-198/2

---

**(සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරමින්) කොළඹ දී පවත්වනු ලබන බස්නාහිර පළාතේ මහාධිකරණයේ දී ය**

| | |
|---|---|
| නඩු අංකය | : CHC/22/2024/CO |
| ස්වභාවය | : සමාගම් |
| කාර්ය පටිපාටිය | : සාමාන්‍ය |
| වටිනාකම | : රු. 1,915,480/- |

මහනුවර, පල්ලේකැලේ, කාර්මික සංවර්ධන මණ්ඩලයේ H3 දරන ගොඩනැගිල්ලේ පිහිටි ''හෙලරට ආයුර්වේද (ප්‍රයිවෙට්) ලිමිටඩ්'' යන ආයතනය පිළිබඳ කාරණයේ දී ය.

*සහ*

හෙලරට ආයුර්වේද (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගමේ කටයුතු අධිකරණය විසින් ගණන් බේරා වසා දැමීම සඳහා 2007 දරන සමාගම් පනතේ 534 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 270(ඉ) වගන්තිය යටතේ වූ ඉල්ලීමක් පිළිබඳ කාරණයේ දී ය.

ගිනිගත්හේන, කොළඹ පාරේ, අංක 29D දරන ස්ථානයේ පිහිටි ''කොපි ෂොප්'' යන නාමය සහ විලාශය යටතේ තනි අයිතිකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන යකන්දාවල ලියන ආරච්චිගේ අනුරුද්ධ යකන්දාවල.

*..........................පෙත්සම්කරු.*

බස්නාහිර පළාතේ, වාණිජ මහාධිකරණය විසින් ඉහත නම් සඳහන් සමාගම ගණන් බේරා වසා දැමීම පිණිස පෙත්සමක් **2024ක් වූ පෙබරවාරි මස 28 වැනි දින** එකී අධිකරණය වෙත පෙත්සම්කරු වෙනුවෙන් නීතිඥ ඩබ්ලිව්. එම්. මලින්ද බණ්ඩාර වාසල මහතා ඉදිරිපත් කර ඇති බව ද, එකී පෙත්සම **2024.07.31** වැනි දින අධිකරණය ඉදිරියේ විභාග කරනු ලැබීමට නියම කර ඇති බව ද, එකී පෙත්සම මත නියෝගයක් කිරීම තහවුරු කිරීම හෝ විරුද්ධ වීමට කැමති එකී සමාගමේ ණයහිමියකු හෝ දායකයකු වේ නම් ඒ තැනැත්තා කාර්යය සඳහා එය විභාග කරන අවස්ථාවේ පෞද්ගලිකව හෝ තමාගේ නීතිඥවරයා මාර්ගයෙන් පෙනී සිටිය හැකි බව ද, පෙත්සමේ පිටපතක් අවශ්‍ය වන එකී සමාගමේ ඕනෑම ණය හිමියෙකුට හෝ දායකයෙකුට ඒ සඳහා නියමිත ගාස්තුව ගෙවූ විට පහත සඳහන් අය විසින් සපයනු ලබන බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

පෙත්සම්කරුගේ නීතිඥ,
ඩබ්ලිව්. එම්. මලින්ද බණ්ඩාර වාසල,
අංක 391, 4/2, 4 වන මහල, වේල්ල වීදිය,
කොළඹ 12.

එකී පෙත්සම විභාග කරන අවස්ථාවේ පෙනී සිටීමට කැමැති ඕනෑම තැනැත්තෙකු තමා විසින් එසේ කිරීමට අදහස් කරන බවට ලිඛිත දැන්වීමක් නීතිඥ ඩබ්ලිව්. එම්. මලින්ද බන්ඩාර වාසල වෙත භාර දිය යුතුය. *නැතහොත්* ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. එම දැන්වීමේ එම තැනැත්තාගේ නම සහ ලිපිනය ද ව්‍යාපාර ආයතනයක් නම් ව්‍යාපාර ආයතනයේ නම ලිපිනය සඳහන් කළ යුතු අතර එය එකී තැනැත්තා හෝ ව්‍යාපාර ආයතනය විසින් හෝ ඔවුන්ගේ නීතිඥවරයෙකු වෙතොත් එම නීතිඥවරයා විසින් අත්සන් කළ යුතුවාක් මෙන්ම **2024.07.30 වැනි දින සවස 6.00** ට පෙර ලැබෙන්නට ද සැලැස්විය යුතුය.

රෙජිස්ට්‍රාර්,
වාණිජ මහාධිකරණය,
කොළඹ.

වර්ෂ 2024 මැයි මස 10 වැනි දින.

05-198/3

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.